# සාරි පොට හනුමන්තා නොකරගමු.



Image-axios.com

ලංකාව හා ඉරානය මුහුණ දෙමින් සිටින්නේ සමාන අවස්ථාවන්ටය.ඉරාන වසන්තය දරුණුය.ලංකාවේ වසන්තය අවශ්‍ය අවස්තාවලදී හොදින් පාලනය කරනු හා ජනතාව පහසුවෙන් උසිගැන් වෙන්නේ  නැති බව පමණක් වැටහේ.රාජපක්ෂලා මැයි 09 ගිනි තියන තුරු ලංකාවේ අරගලය සාමකාමී විය.ඒ අතරේ සාරිය පාරට දැම්මේ කව්රුන්දැයි සිතීම වටී.ඉරානයේ හිස් ආවරණය නිසා ඇතිවූ ගැටුමම ශ්‍රී ලංකාවේ බිහි කිරීමට ගන්නා උත්සාහයක් පෙනේ.එය ගෙන එන්නේ කව්රුන්දැයි මට නම් රහසක් නොවේ.භූ දේශපාලනයේ රූකඩ මන්දපෝෂණයෙන් පෙලෙන දරුවන් ගැන නොව,ඒ දරුවන්ට බත් පත ගෙදරින් ගෙනගොස් වේලක කුසගිනි නිවන ගුරු සිත ට අත තබා තිබීම හොඳ ලක්ෂණයක් නොවේ.සාරි ප්රශ්නය මේ මොහොතේ අනවශ්‍ය හෝ අවශ්‍ය ප්රශ්නයක් නොවේ.එයට භික්ෂූන්  සම්බන්ධ වීමට ගන්නා උත්සාහය ඉරාන මොඩලය සම්පුරණ කරයි.

මෙය ලංකාව කෙරෙහි නිදහසක්,නිවීමක් හෝ ස්ථාවරත්වයක් ඇති නොවීමට ගෙන එන එකින් එක මාතෘකා බව සැලකිය යුතුය.ප්රජාතන්ත්‍ර වාදී සංවාද වලට යාම වැලකීම හා රට ආර්ථිකව මේ මට්ටමේ තබාගැනීම හා රාජපක්ෂලා ගේ බලය කාලයක් පවත්වාගෙන යාමට වික්රමසිංහට බලකිරීම යන කරුණු සියල්ල මේ සංසිද්ධි මැවීම තුල අඩංගුය.අනෙක් අතින් රුසියාවට මිත්‍ර පිලේ අවධානය තම තමන්ගේ ප්රශ්න වලට යොමුකරවීම..චීනයට අපේ අවධානය නොලැබීම සහතික කිරීමට වැනි කරුණු රාශියක විකාරයක් මේ එසවෙන මාතෘකා තුල පවතී.

ගුරුවරුන්ගේ ඇඳුම තීරණය කරන්නේ ගුරුවරු මිස අපවත් ස්වාමින්වහන්සේලාවත් ,සමස්ථය නියෝජනය නොකරන,දේශපාලන න්‍යායපත්‍ර වලට රංගනයේ යෙදෙන වෘත්තීය සමිතිනියෝජිතයන්ද  නොවේ.එය ගුරුවරුන්ගේ හදවත් තුලින් පැමිණෙන කරුණු මත තීරණය විය යුතුය.සාරිය බැරියෝ..කියා ගුරුවරියන් පාරේ ගිය බවක් මතක නැත.ඒ නිසා පවත්නා විශාල අර්බුධයක් තුල සංවේදී සංස්කෘතික තේමාවලින් ජනමනස විකෘතිකර වෙනත් සංවාද මැවීම වැළකිය යුතුය.

ඇමෙරිකානු විරෝධීන් සියළු දෙන යුධ නැව අමතක කලේ පාරට බැසීමෙනි,නැතහොත් නොබැසිමෙනි ,නැතහොත් පාරට බැස්සවීම මාතෘකාවක් කරගෙනය.යුධ නැව රටක් හැටියට අපට කරනු ලබන දේශපාලන,ආර්ථික හා කලාපීය  බලපෑම ගැන හාන්කවිසියක් නැත.සියළු දෙනාම චන්ග් නෝනා හමුවී ජයාරූප ගෙන තිබීම පමණක් අපි දකිමු.ලෝකය හා එහි දිශානතිය ගැන අවබෝධයක් නැති ජනතාව සාරි පොටට ගිනි තබා රටට ගිනි තබන්නට පෙර සාරියේ අයිතිය ගැහැණියට දී ස්වාමින්වහන්සේලා ද වෘත්තීය සමිතිද කටපියාගෙන සිටීම වටී.ගුරු සමස්තයෙන් වැඩි දෙනෙක් සාරියට නොවේ නම්..එය ගුරු සංගම්වල එකතුවකින් ගත යුතු තීරණයකි.අපේ රට ඉරානයක් නොකර අපේම ක්‍රමයකට ගලවා ගැනීමකට අප යා යුතුය.මේ මොහොතේ සියළුම දේශප්‍රේමීන් සිතිය යුත්තේ එයය.

-Subhashini Wipfler